සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ..............................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- පළමු කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1,2,3,4 පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

- අංක (01) සිට (03) තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් දක්වා ඇති යෙදුම්වල අර්ථය තෝරා යටින් ඉරක් අඳින්න.

01. තංගීගේ ක්‍රීඩා ජයග්‍රහණය දැනගත් විගස අම්මා "මගේ ඉහේ මලක් පිපුණා" යි පැවසුවා ය.
1. බලවත් සන්තාපයක් 2. සතුට හා අපේක්ෂාවන් 3. අධික සන්තෝෂයක් 4. හිසට බරක්

02. සමාජ පරිහානියට හය හතර නොදන්නා මිනිසුන්ගේ ක්‍රියා කලාපය ද හේතු වී ඇතැ යි කියැවේ.
1. දැනුමක් නැති 2. ඉලක්කම් නොහඳුනන 3. තමා ගැන ම සිතන 4. හොඳ නරක නොදත්

03. "ඔය ඇයිහොඳයිකම් තම වැඩිදුර ගෙනියන්න එපා" යි අත්තම්මා අයියාට කීවා ය.
1. හිතවත්කම් 2. අමනාපකම් 3. වෙනස්කම් 4. තොරතුරු

- අංක 4, 5 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

04. නිර්මාණාත්මක ප්‍රබන්ධ රචකයා කියවන්නා තුළ කතා රසයක් .............................. වන පරිදි සිය කතාව ගෙත්තම් කරයි.
1. අන්තර්ගත 2. ජනනය 3. දැක්වෙන 4. නිර්මාණය

05. තේරවිලිවලට නිවැරදි ව පිළිතුරු දීම .............................. ප්‍රකට කරන කරුණක් ලෙස සැලකේ.
1. පාණ්ඩිත්වය 2. විත්දනය 3. සාක්ෂරතාව 4. චතුර බව

06. අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද සහිත පිළිතුර තෝරන්න.
1. පරිගණක, දූෂණ, අක්ෂර, නිශ්ඵල 2. ප්‍රතිඵල, භයානක, රක්ෂණ, නවීකරණ
3. නිෂ්පාදනය, චන්දය, උච්ඡාරණය, භික්ෂු 4. ලේඛණ, භීෂණය, අවබෝධය, ප්‍රශ්න

07. ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ ස්ථානභාර නිලධාරී පිරිසක් අධික වෙහෙසක් දරමින් ගවේෂණ කටයුතුවල නිරත වූහ.

මෙම වාක්‍යයේ ඇතුළත් මහාප්‍රාණ අක්ෂර ගණන කීයද?
1. 2 2. 3 3. 4 4. 5

08. පහත දැක්වෙන පද අකාරාදි පිළිවෙළට සැකසූ විට අවසානයට යෙදෙන පදය තෝරන්න.
ශූරතාව, වික්‍රමය, ප්‍රතාපය, වීරත්වය, කෞශල්‍යය
1. වික්‍රමය 2. ප්‍රතාපය 3. ශූරතාව 4. වීරත්වය

09. "වහා තාගේ කඩුව හා දුනු හී බිම දමා මට නමස්කාර කරව" යන වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියාපද වර්ග නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. මිශ්‍ර ක්‍රියා, - විධි ක්‍රියා
2. විධි ක්‍රියා - පූර්ව ක්‍රියා
3. පූර්ව ක්‍රියා - විධි ක්‍රියා
4. පූර්ව ක්‍රියා - මිශ්‍ර ක්‍රියා

10. "නොපැහැර පියහැර සියොත්හු ද ඉද අසති" යන වාක්‍යයේ පිය යන බහ්වර්ථ පදයේ අර්ථය තෝරන්න.
1. පියාපත් 2. පිහාටු 3. පාද 4. ප්‍රිය

11. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පදයක් නොවන පිළිතුර තෝරන්න.
නෙලුම 1. සියපත 2. උත්පල 3. කමල 4. අරවින්ද

12. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන පිළිතුර තෝරන්න.
1. මිහිරි - සුමිහිරි 2. සශ්‍රීක - නිශ්‍රීක 3. අල්ප - අනල්ප 4. මෘදු - රළු

13. පහත දැක්වෙන යුගල පදවලින් තුනක් එක් වර්ගයකට අයත් වේ. නොගැළපෙන යුගල පදය තෝරන්න.
1. කෙළි සෙල්ලම් 2. යාන වාහන 3. ගිහි පැවිදි 4. සුව පහසු

14. "හේතු අනුව යමක් සිතා ගැනීම" යන්නට යෙදෙන තනි පදය තෝරන්න.
1. නිරීක්ෂණය 2. ගවේෂණය 3. ප්‍රත්‍යක්ෂ 4. අනුමානය

15. උක්ත හා අනුක්ත පද වැරදි ලෙස යෙදුණු පිළිතුර තෝරන්න.
1. ළමයා - ළමයින් 2. සත්තු - සතුන් 3. ගායකයෙක් - ගායකයෙකු 4. දැරියක් - දැරියක

16. ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.
1. ගුරුවරු සිසුන් යහමග යවයි.
2. කොටියෙක් ගොදුරු සොයා වනයට ගියේ ය.
3. මව කුඩා දැරියක් තමා ළඟට කැඳවා ගත්තා ය.
4. ශිෂ්‍යාවන් අපූරු රංගනයක් ඉදිරිපත් කළෝ ය.

17. තද්ධිත පදයක් නොවන පදය තෝරන්න.
1. දේශීය 2. දුබලතා 3. ශිෂ්‍යත්ව 4. ඉමිහිරි

18. මහා සිංහල ශබ්ද කෝෂයේ දැක්වෙන පරිදි මුලින් දී ඇති අර්ථය වැරදි ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.
1. කිරි පුබ්බරු - කිරිබත්
2. කිරිජ්ජ - උල් පිහිය
3. කිරි තෙල් - ගිතෙල්
4. කිරිමුවා - ගණදෙවි

19. පහත දැක්වෙන පිරුළු අතුරින් එක් පිරුළක් වෙනස් අර්ථයක යෙදේ. එම පිරුළ තෝරන්න.
1. ගඟට ඉනි කපනවා
2. අහසට ඉනිමං බඳිනවා
3. හිල් කුඩෙන් වතුර අදිනවා
4. අඟේ ඉදන් කන කනවා

20. යම් ප්‍රකාශයක් වැඩිදුරටත් පැහැදිලි කිරීම සඳහා භාවිත වන විරාම ලකුණ තෝරන්න.
1. සරල වරහන් 2. සඟල වරහන් 3. තිත් තුන 4. දෙතිත

(ලකුණු 2 × 20 = 40)

2025 01 -

## II කොටස

- 01 හා 02 ප්‍රශ්න අනිවාර්යය වේ.
- 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පන්ති කාමරයේ දී දේශාභිමානී හැඟීම් ජනිත කරවන සාහිත්‍යාංග යන මාතෘකාව යටතේ ඔබ විසින් නිර්මාණය කරන ලද කුඩා පොත ඇසුරෙන් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   1. දේශාභිමානී හැඟීම් ඇතුළත් සාහිත්‍යාංග ලෙස ඔබ, ඔබේ කුඩා පොතට ඇතුළත් කළ නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 04)
   2. එහි ඇතුළත් අංග සොයා ගැනීමේ දී ඔබට මග පෙන්වූයේ කවුරුන් ද? (ලකුණු 02)
   3. එහි සඳහන් දේශාභිමානී ගීත දෙකක මුල් පේළිය ලියන්න. (ලකුණු 04)
   4. පොත සකස් කිරීමට පෙර ගුරුතුමා/ගුරුතුමිය දුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)
   5. දේශාභිමානී හැඟීම් උපදවන එම නිර්මාණ නිසා ඔබේ සිතේ ඇති වූ හැඟීම් හතරක් ලියන්න. (ලකුණු 04)

   (මුළු ලකුණු 16)

02. පහත දී ඇති මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.
   1. අපේ පරිසරය අපි ම සුරකිමු
   2. යහපත් උපදේශ දිවිය ම සරු කරයි
   3. බොදු පුනරුදයේ සෙන්පති මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියෝ
   4. වස විස නැති දේශීය ආහාර පරිභෝජනය කරමු (ලකුණු 14)

03. පෙළපොත ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   1. "මේක කාටත් පොරෝජන වෙන දෙයක්"
      (i) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.
      (ii) මෙය ශ්‍රවණය කළේ කවුරුන් ද?
   2. "ඉස්සර අපේ අම්මලා මේ වෙලාවට ළිඳෙන් වතුර ගන්නේ නෑ"
      (i) මේ වේලාව යනු කිනම් වේලාවක් ද?
      (ii) මෙසේ කීවේ කවුරුන් ද?
   3. "තොපේ වරිගෙ නම් පිරිමින්ටත් දොළදුක් ගායවල් හැදෙන පාටයි"
      (i) මෙසේ කීවේ කවරෙකු විසින් ද?
      (ii) මෙම ප්‍රකාශය උපුටා ගත් පාඩම කුමක් ද?
   4. "මා ඔබට නැවත නැවත ගයන්නම්"
      (i) මේ ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය ලියන්න.
      (ii) එහි රචකයා නම් කරන්න.
   5. "ඔය අතේ තියෙන සල්ලිවලින් ශත දහයක් දීලා බොත්තමක් ගන්න ඕනෑ"
      (i) මෙසේ කීවේ කාට ද?
      (ii) මෙම කෙටිකතාව ලියූ රචකයාගේ වෙනත් පද්‍ය කෘතියක නම ලියන්න. (ලකුණු 1 × 10 = 10)

04. ගමේ එක්සත් ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න. මේ දිනවල ප්‍රදේශය පුරා පැතිර යන ඩෙංගු මර්දනය සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කර ඇත. එහි දී ගම්වාසීන් දැනුවත් කිරීමේ දේශනයකට පැමිණෙන ලෙස ඉල්ලමින් ප්‍රාදේශීය රෝහලේ වෛද්‍ය අධිකාරීතුමා වෙත යවන රාජකාරි ලිපිය ලියන්න.

   (ලකුණු 10)

05. පහත දැක්වෙන කෘතිවල කතුවරුන් ලියන්න.

1. ගීතාංජලී -
2. පෙත්සම -
3. ඔබා මුහු දම -
4. ජීවන සුවඳ -
5. සැලළිහිණි සන්දේශය -
6. බුද්ධ ඇදහිල්ල -
7. වහල්ලු -
8. මනමේ නාටකය -
9. රන් කැකිර හා තවත් කතා -
10. සද්ධර්මරත්නාවලිය -

(ලකුණු 1 × 10 = 10)

06. පහත දැක්වෙන පද්‍යවල හිස්තැන් පුරවන්න.

1. හඳහාමී අප දිහාව
එබී බලයි පා හිනාව
..............................................
..............................................

2. මගේ නංගිගෙ පොඩි හිනාව
වගේ ය මේ පිච්ච පොකුර
..............................................
..............................................

3. අපේ පැතුම් අහසට විහිදී යයි
කම්හල්වල දුම් වළලු දිගේ
..............................................
..............................................

4. ..............................................
..............................................
කොත් සතරයි කණු සතරයි ගෙට ඇතුවා
තෝරාපන් ඊයේ මග දී දුටුවා

5. ළිප ගිනි මොළවන තෙක් දිය සැළියේ
සැපයක් යැයි කකුළුව දිය කෙළියේ
..............................................
..............................................

(ලකුණු 1 × 10 = 10)

07. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුර රාජධානිය අනුරාධ නම් වූ පුරුෂයෙකු විසින් කදම්බ නදී තීරයෙහි පිහිටුවන ලද පුරාණ ස්ථානයක පණ්ඩුකාභය කුමරුවා විසින් ගොඩනංවන ලදි. මෙම නගරය සෞන්දර්යාත්මක හා ප්‍රායෝගික යන දෙකරුණට ම සුදුසු වන සේ සැලසුම් කරන ලදි. තඩාග හා ගෘහ මන්දිර, විහාරාරාම හා දේවාගෘහ, ආරෝග්‍යශාලා හා සාන්තු නිවාස වැනි සියලු ම නගරාංග හා සුව පහසුකම් ද ඔහු නගරය තුළ නිර්මාණය කරවී ය. ඊට පෙර එහි නොවූ විරූ ප්‍රමාණයකට විහාරාරාම, දාගැබ් ආදී ආගමික ගොඩනැගිලි එහි තනවන ලද්දේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී ය. එසමයේ දී ලංකාවට අලුතෙන් ලැබුණු බුදුසමය රටවැසියාගේ හා රජුගේ ද සිත් අතිශයින් ම පැහැද වී. එහෙයින් ජනප්‍රධානීහු හා රටවැසියා ද අලුත් ආගමට ආධාර කිරීමට එක්වූහ. වරක් රජුගේ මඟුල් උයන වූ මහමෙවුනාව ඉන්පසුව බෞද්ධ කටයුතුවල මධ්‍යස්ථානය විය.

i. අනුරාධපුර රාජධානිය ගොඩනගන ලද්දේ කවුරුන් විසින් ද?

ii. නගරය සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ ප්‍රධාන කරුණු දෙක ලියන්න.

iii. දේවානම්පියතිස්ස රජු දවස සිදුවූයේ කුමක් ද?

iv. අලුතින් ලැබුණු බුදුසමය රජුගේ රටවැසියාගේ සිත් පැහැදවීම නිසා කුමක් සිදුවී ද?

v. "මහමෙවුනාව" වැදගත් වීමට හේතු වූ කරුණු දෙක ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

(මුළු ලකුණු 60 යි)